*සැ. යු.* - (i) 2023.01.05 වැනි දින පළ කරන ලද අංක 2314 *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,315 - 2023 ජනවාරි මස 13 වැනි සිකුරාදා - 2023.01.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 16 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 17 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 පෙබරවාරි මස 03 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 ජනවාරි මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


15 - B 082418 - 353 (2023/01)
E -1

# ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම්

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) ඉසංක ලක්මාල් වික්‍රමනායක වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2000.02.24 දින ප්‍රදානය කර ඇති අංක හම්/11/ප්‍ර 54632 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 163, කුඩා ගම්මාන 18, දකුණු ඉවුර, ලුණුගම්වෙහෙර පදිංචි නාඔටුන්න ගම් ආචාරිගේ නිලූකා නිශාන්ති වෙත ප්‍රදානය කොට හම්/11/ප්‍ර 54632 දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක හම්/319/1229/2004 යටතේ 2004.08.17 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන උප වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවක් ඇත්නම් එය **2023.02.03** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාගම් පත්තුවේ කරඹවැව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු ඉවුර, කුඩා ගම්මාන 18 නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක - 163 (නිවාස) දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් රූඩ් 02ක විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | අභ්‍යන්තර පාර, |
| *නැගෙනහිරට* | : | අංක 162 නිවාස ඉඩම, |
| *දකුණට* | : | රජයේ ඉඩම, |
| *බස්නාහිරට* | : | අංක 164 නිවාස ඉඩම. |

අයි. එල්. වික්‍රමනායක,
ප්‍රාදේශීය ලේකම්,
ලුණුගම්වෙහෙර.

2020 පෙබරවාරි මස 12 වැනි දින

01-140/1

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) ඉසංක ලක්මාල් වික්‍රමනායක වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2000.08.22 දින ප්‍රදානය කර ඇති අංක හම්/11/ප්‍ර 55247 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 938, කුඩා ගම්මාන 09, දකුණු ඉවුර, ලුණුගම්වෙහෙර පදිංචි චිත්‍රානන්ද රණතුංග වෙත ප්‍රදානය කොට හම්/11/ප්‍ර 55247 දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක - යටතේ - දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකුවීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන උප වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය **2023.02.03** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාගම් පත්තුවේ සමන්පුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු ඉවුර, කුඩා ගම්මාන 09 නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක - 938 (නිවාස) දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් රූඩ් 02ක විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | අංක 939 නිවාස ඉඩම, |
| *නැගෙනහිරට* | : | අංක 937 නිවාස ඉඩම, |
| *දකුණට* | : | අභ්‍යන්තර පාර, |
| *බස්නාහිරට* | : | අභ්‍යන්තර පාර. |

අයි. එල්. වික්‍රමනායක,
ප්‍රාදේශීය ලේකම්,
ලුණුගම්වෙහෙර.

2020 පෙබරවාරි මස 12 වැනි දින.

01-140/2

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/69502.
අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : EP/28/LB/LS/TRI/MOR/12..

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, මොරවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් නොච්චිකුලම 230 සී ග්‍රාම නිලධාරි වසමේ, මයිලකුඩාවැව ගමේ දළ අනුරේඛනයෙ හි දරන ප්‍රමාණයෙන් පර්චස් 60ක් වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා විල්ලේගොඩ ගමගේ ඩේසි ඉන්ද්‍රාණි මිය නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත දැක්වේ :

ඉඩමෙහි මායිම්:
*උතුරට* : රජයේ ඉඩම,
*නැගෙනහිරට* : රජයේ ඉඩම,
*දකුණට* : ඒ 12 මාර්ගය,
*බටහිරට* : ගැමි රස හෝටලයට අයත් ඉඩම.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2022.10.07 දින සිට ඉදිරියට)

*වාර්ෂික බදු මුදල*.- 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 2%කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර එයට කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල*. - වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඉ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඊ)* 2022.10.07 දින සිට අවුරුදු 05ක කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(උ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

*ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

කේ. එල්. පී. සුභාෂිණි,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2022 දෙසැම්බර් මස 27 වැනි දින,
අංක 1200/6 හි, ඉඩම් මහ ලේකම් කාර්යාලය,
''මිහිකත මැඳුර'', රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

01-138

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/70740.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : EP/28/LB/L10/LS/TRI/KUC/112.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කුඹුරුපිට්ටි නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ, කුඹුරුපිට්ටි නැගෙනහිර ගමේ අංක PLC/EP/28/SUR/2018/002 දරන අනුරේඛනයෙහි කැබලි අංක 12 දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර්

0.84093 ක් වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා මරක්කලගේ චන්දන උදය කුමාර මහතා නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත දැක්වේ :

කැබලි අංක 12 හි මායිම්:

*උතුරට* : PLC/EP/28/SUR/2018/002 පිඹුරෙහි කැබලි අංක 1 සහ 14,
*නැගෙනහිරට* : PLC/EP/28/SUR/2018/002 පිඹුරෙහි කැබලි අංක 14 සහ 16,
*දකුණට* : PLC/EP/28/SUR/2018/002 පිඹුරෙහි කැබලි අංක 16 සහ 13,
*බටහිරට* : PLC/EP/28/SUR/2018/002 පිඹුරෙහි කැබලි අංක 13 සහ 01.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2022.10.07 දින සිට ඉදිරියට)

*වාර්ෂික බදු මුදල.*- 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2%කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර එයට කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල.* - වාර මුදලක් අය නොකෙරේ.

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

(ඈ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(උ) 2022.10.07 දින සිට අවුරුදු 05ක කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

*ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට සති 06ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

කේ. එල්. පී. සුභාෂිණී
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2022 දෙසැම්බර් මස 29 වැනි දින,
අංක 1200/6 හි, ඉඩම් මහ ලේකම් කාර්යාලය,
''මිහිකත මැදුර'', රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

01-139

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.